

# දෙවියෝ දුන් හැකියාව
## සහ සමාජය දුන් රැකියාව

**නම ?**
වීරයියා නාගරාජා

**ගම ?**
තලවකැලේ ආගරපතන

**කොළඹට වෙලා මොකද කරන්නේ ?**
සිකුයුරිටි රස්සාවක් කරනවා.

**කොච්චර කල්ද ?**
අවුරුදු දාසයක් විතර.

**කොළඹ එන්න හේතුව ?**
රස්සාවක් හොයාගෙන ආවා. එහෙ රස්සාවල් නෑනේ.

**මේ රස්සාව හොඳයිද ?**
ගෙදර ප්‍රශ්න ටික විසඳ ගන්න පඩියක් ලැබෙනවා.

**ගෙදර කවුද ඉන්නේ ?**
දුව විතරයි. පවුල අවුරුදු දෙකකට කලින් අන්තරා වුණා. පුතා කසාද බැඳලා වෙන්වෙලා ජීවත්වෙනවා.

**මේ නිර්මාණ කරන්න යොමු වුණේ කොහොමද?**
ඉස්කෝලේ යන කාලේ ඉඳලම චිත්‍ර අඳින්න, මේ වගේ දේවල් හදන්න මට ලොකු ආශාවක් තිබුණා. ඒ නිසා දිගටම ඉඩක් ලැබෙන වෙලාවට ඒවා කළා. කවුරුවත් කියලා දීලා නැහැ. ඉබේම වගේ තමයි හැකියාව ලැබුණේ. දෙවියෝ දීපු දෙයක් තමයි.





**රස්සාවට කරන අතරේ මේවාට යොමු වෙලා දැන් කොච්චර විතර කල්ද ?**
මේවා හදන්න පටන් අරන් දැන් අවුරුදු දෙක තුනක් වෙනවා. කලින් චිත්‍ර ඇන්දා. මේ කන්තෝරුවට එන පිටරට මහත්තරු ඒ චිත්‍ර අරගෙනත් ගිහන් තියනවා. සෙනසුරාදා ඉරිදා ඔෆිස් එක වහලා නිසා ඒ දවස්වල තමයි මේ නිර්මාණ කරන්නේ.

**මේවා හදන්න මොනවද පාවිච්චි කරන්නේ ?**
වැඩිපුරම රිජිෆෝම් තමයි. කඩවල්වලින් හොයා ගන්නවා.

**එක නිර්මාණයක් කරන්න කොච්චර විතර වෙලාවක් යනවද ?**
දවසක් වගේ යනවා.

**මේවා විකුණනවද ?**
නෑ. ඔෆිස් එකේ තියලා තියනවා. ඔෆිස් එකට එන සමහර මහත්තරු වෙලාවකට එකක් දෙකක් අරගෙන යනවා. පොඩි ළමයි කවුරු හරි ආවොත් ඒ අයට දෙනවා.

**මේ විදිහට කාලය ධනය ශ්‍රමය වැය කරගෙන මේවා හදන එකෙන් මොකක්ද ලැබෙන්නේ ?**
මේ වගේ දෙයක් හැදුවම මගේ හිතට හරි සන්තෝෂයක් දැනෙනවා.




**මේවා විකුණන්න පුලුවන්නේ ?**
මේ විදිහේ රස්සාවක් කරන ගමන් එහෙම කරන්න අමාරුයි. මට මගේ රස්සාව ගොඩක් වටිනවා. ඒකෙන් තමයි මම ගෙදර ප්‍රශ්න විසදගන්නේ. ඒ නිසා විවේක වෙලාවට හදලා තියනවා. කවුරු හරි ඉල්ලුවොත් දෙනවා.

**එහෙම ඉල්ල ගන්න අය මුදලක් දෙනවද ?**
මුදල් බලාගෙන නෙවෙයි දෙන්නේ. මම හිතන්නේ කලා නිර්මාණයක් ඒ විදිහට මුදලකට තවත් කෙනෙකුට විකුණන්න බෑ. මේක ගොඩක් වටිනවා. නමුත් කාලයක් ආවොත් මේව විකුණගන්නත් පුලුවන්.

**මේ වගේ හැකියාවක් තියෙද්දි ජීවිතේම සිකියුරිටි රස්සාවකට කොටුවීම ගැන මොකද හිතෙන්නේ ?**
හැකියාවක් තිබුණට මේවා හදලා විකුණලා ජීවත්වෙන්න බෑනේ. එහෙම කරලා කීයක් හරි හොයාගන්න එක ගොඩක් අමාරුයි. මොකක් හරි රස්සාවක් කරගෙන පඩියක් ගත්තොත් තමයි ජීවත්වෙන්න පුලුවන්වෙන්නේ. ඒ නිසා රස්සාවට මුල් තැන දෙනවා.

**කාට හරි ඔබේ මේ නිර්මාණයක් ගන්න වුවමනා වුණොත් ?**
මගේ දුරකථන අංකය 077-2892326. කතා කරන්න. මම දෙන්නම්.

කතාබහ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

